**ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමය 37 වන විධායක කමිටුවේ වාර්ෂික වාර්තාව**
**2020 මැයි 21 දින සිට 2021 ඔක් 25 දින දක්වා**

**ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමය: හැඳින්වීම සහ ඉදිරිය.**

ශ්‍රී ලංකාවේ රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයට දායකවෙමින් එම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන ප්‍රමුඛතම රජයේ විධායක නිලධාරීන් අයත්වන ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් නියෝජනය කරන එකම වෘත්තීය සංගමය ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමයයි. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති මූලික අයිතියක් වන වෘත්තීය සමිති පිහිටුවීමේ සහ වෘත්තීය සමිතිවලට බැඳීමේ නිදහස අනුව ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන්ගේ වෘත්තීය අයිතිවාසිකම් හා වරප්‍රසාද සුරැකීම හා වෘත්තීය අභිවෘද්ධිය අරමුණු කරගත් අප සංගමය 1935 අංක 14 දරණ වෘත්තීය සමිති ආඥා පනත යටතේ ලියාපදිංචි වෘත්තීය සමිතියකි.

**ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සියලුම සාමාජිකයින් වෘත්තීය සමිතියක් ලෙස සංවිධානය කරමින් අප සංගමය පහත කරුණු අරමුණු කරයි.**

- සියලුම සාමාජිකයින්ගේ වෘත්තීය අයිතිවාසිකම්, වරප්‍රසාද, හා සේවා ප්‍රතිලාභ වැඩි දියුණු කිරීමට සහ ආරක්ෂා කිරීමට පියවර ගැනීම.
- සාමාජිකයින්ට ඔවුන්ගේ වෘත්තීය සහ වෙනත් ගැටළු/ආරවුල් වලදී මූල්‍ය ආධාර, නීති අධාර/උපදෙස් සහ වෙනත් සුදුසු ආකාරයකින් සහාය වීම.
- සාමාජිකයින්ගේ වෘත්තීය සහ සේවා තත්වයන් ආර්ථික, සමාජීය, අධ්‍යාපනික, වශයෙන් වැඩිදියුණු කිරීම සහ ආරක්ෂා කිරීම.
- සාමාජිකයන් අතර ප්‍රශස්ත මට්ටමේ විනයක් හා ආචාර ධර්ම පද්ධතියක් ඇති කිරීම සහ ශ්‍රී ලංකා පරිපාලන සේවය රාජ්‍ය සේවයේ විශිෂ්ටත්වයට පත් කිරීම.
- රාජ්‍ය පරිපාලනයට හා පරිපාලන සේවයට බලපාන කාරණා සම්බන්ධයෙන් මැදිහත් වී රජයට නිර්දේශ සහ යෝජනා ඉදිරිපත් කිරීම.
- සංගමයේ කාන්තා සාමාජිකාවන්ගේ අභිවෘද්ධිය සඳහා සුවිශේෂී පියවරයන් ගැනීම.
- ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සහ එහි සාමාජිකයන්ගේ ප්‍රතිලාභ හා අභිවෘද්ධිය සඳහා අදාළ යැයි සැලකෙන වෙනත් කරුණු සම්බන්ධව අවශ්‍ය පියවර ගැනීම.

බ්‍රිතාන්‍ය සිවිල් සේවය (1802), ලංකා සිවිල් සේවය (1833), සහ ලංකා පරිපාලන සේවය (1963), යන යටත් විජිත සිවිල් සේවාවන් හි වර්තමාන නියෝජනය වන ශ්‍රී ලංකා පරිපාලන සේවයේ (1972 සිට) නිලධාරීන්ගෙන් සැදුම්ලත් අප සංගමය ඉහත සාමාන්‍ය වෘත්තීය සමිතියක දැක්ම හා අරමුණු අභිබවා ගොස් 21 වන සියවසට අවශ්‍ය පොදු ජනසමාජය අපේක්ෂා කරන වඩා ප්‍රශස්ථ රාජ්‍ය සේවාවක් වෙනුවෙන් රාජ්‍ය ප්‍රතිපත්ති, ක්‍රමවේදයන් හා ක්‍රියා පටිපාටි යාවත්කාලීන කිරීමට සැමවිටම කැපවී සිටියි.

ඒ යටතේ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පොදු කාර්යය භාරය වන රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය හා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම හා අනුෂාංගික වන,
1. සියලු පාර්ශව සමඟ මනා සම්බන්ධතාවයක් හා සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින්,
2. මධ්‍යස්ථභාවය, අපක්ෂපාතීභාවය, හා පාරදෘශ්‍යභාවය පදනම් වූ ක්‍රියාමාර්ග අනුගමනය කරමින්,

3. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය රාජ්‍ය සේවයෙන් අපේක්ෂා කෙරෙන්නා වූ අරමුණු වෙත එළඹීම පිණිස විශිෂ්ඨ රාජ්‍ය සේවයක් ගොඩනැංවීම සඳහා නායකත්වය සැපයීම, මෙහෙයවීම, හා මාර්ගෝපදේශකත්වය ලබාදීම, යන බහුවිධ කාර්යයභාරයට අවශ්‍ය වෘත්තීය පහසුකම් සැපයීම ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමය අරමුණු කරයි.

ඉහත සඳහන් කළ අරමුණු වෙත ප්‍රවේශ වීම සඳහා රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාකාරීන් හා ප්‍රතිපත්ති ව්‍යවසායකයින් ලෙස අප හොඳම විද්‍යාත්මක න්‍යායන් හා ආකෘතීන්හි අන්තර්ගතය කෙරෙහි ධනාත්මකව හා සාධණීයව ප්‍රවේශවීම අත්‍යාවශ්‍ය වේ. විශේෂයෙන්ම දැනුම් න්‍යායයන්හි විෂය පථය, ක්‍රම, හා වලංගුභාවය විමසමින්, යුක්ති සහගත හා සාධාරණීකරණය කරන ලද විශ්වාසයන් සහ හුදෙක් මතයන් අතර වෙනස අවබෝධ කරගැනීම මහජන හිතකාමී ප්‍රතිපත්ති තීරණ ගැනීමේදී ඉතා වැදගත් වේ.

එසේම රාජ්‍ය ප්‍රතිපත්ති හා බැඳුනු බලවේග, ආයතන සහ ක්‍රියාවලීන් පිළිබඳ විවේචනාත්මකව විශ්ලේෂණයෙන් විද්‍යාත්මක න්‍යායන් පොදු සමාජයීය අවශ්‍යතාවයන් සඳහා සාධාරණව සැකසිය හැකි බවත් විද්‍යාවේ ප්‍රගතිය සමස්ත සමාජ ප්‍රගමනයට ප්‍රශස්ථව යොදාගැනීම සඳහා එසේ කළ යුතු බවත් අප තරයේ විශ්වාස කල යුතුය. ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමයේ සාමාජිකත්වය තුල ඵලදායී හා විවේචනාත්මක සංවාද මේ සඳහා කදිම ප්‍රවේශයක් වේ.

**වර්ෂයතුල කාර්යසාධනය**

1. ව්‍යවස්ථාපිත කාර්යයන්
    a. ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමයේ 37 වන විධායක සභාව පත්වූ දින සිට මේ දක්වා මාසික විධායක රැස්වීම් 25ක් විශේෂ විධායක කමිටු රැස්වීම් 10ක් සහ අනෙකුත් සාකච්ඡා 10කට අධික සංඛ්‍යාවක් පවත්වා ඇත (වගුව 1).
    b. ව්‍යවස්ථාවේ 9.2 වගන්තිය අනුව දිස්ත්‍රික්ක 12 ක ශාඛා සංගම් ප්‍රතිසංවිධානය සඳහා අප මව් සංගමය වෙනුවෙන් සහභාගිවී ඇති අතර එහි දී හුදෙක් ශාඛා සංගම් ප්‍රතිසංවිධානයට එහා ගිය ශ්‍රී ලංකා පරිපාලන සේවයේ අභියෝග හා ඉදිරි ගමන පිලිබඳ කතිකාවක් ලෙස මෙම හමුවීම් යොදාගන්නා ලදී.
    c. ඉහත දිස්ත්‍රික් රැස්වීම් වලට අමතරව ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 2019 සිට 1991 දක්වා වන කණ්ඩායම් වල නියෝජිතයින් සමඟ විධායක කමිටුව සාකච්ඡා පවත්වා ඔවුන් සියළු දෙනාගේ අදහස් ලබා ගෙන ඇත.
    d. ව්‍යවස්ථාවේ 8.2 වගන්තිය අනුව සංගමයේ මහා මණ්ඩලය 2021.02.09 දින පැවැත්වීමට කටයුතු කර ඇත.
2. වෘත්තීය අභියෝග මැදිහත්වීම් හා අත්කරගත් වෙනත් ජයග්‍රහණ
    a. විධායක කමිටුව වෙත ඉහත 1.a හා 1.b පරිදි මෙතෙක් පවත්වන ලද දිස්ත්‍රික් රැස්වීම් හා 2019 සිට 1991 දක්වා වන කණ්ඩායම් වල නියෝජිතයින් සමඟ සාකච්ඡා වලදී ඉදිරිපත් වූ අදහස් හා යෝජනා එක්කර රාජ්‍ය සේවා අමාත්‍යාංශය වෙත යොමුකර/ සාකච්ඡා කර ඇති අතර එහි දී එකඟ වූ කරුණු සඳහා ඉදිරි පියවර ගනිමින් පවතී (වගුව 2).
    b. සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයට අදාලව ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමයේ දායකත්වය පිලිබඳව 2020.08.22 දින අරලියගහ මන්දිරයේ දී සංගමයේ විධායක කමිටු සාමාජිකයින් හා ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ සංගමයේ සාමාජිකයින් ගරු බැසිල් රාජපක්ෂ මහතා සමඟ සාකච්ඡා කරන ලදී.

c. ඉහත සාකච්ඡාවට සම්බන්දව 2020.09.11 දින “SASA Forum 2020 on Vistas of Prosperity & Splendour” වැඩමුළුව අප සාමාජිකයින් 106 කගේ ක්‍රියාකාරී සහභාගිත්වයෙන් සාර්ථකව පවත්වන ලද අතර එයට අදාල ප්‍රකාශනය මුද්‍රණය කර අවසන් කර ඇත. https://www.sasa.lk/resources/13/SASA-Forum-2020.pdf

d. ශ්‍රී ලංකා පරිපාලන සේවාවට බඳවා ගැනීමේ විභාගයේ උත්තර පත්‍ර පරීක්ෂාවෙන් අප සේවයේ ජෝෂ්ඨ නිලධාරීන් ඉවත් කිරීමේ උත්සාහයක් (2020 ජුලි මස) සංගමය මැදිහත් වීමෙන් ව්‍යර්ථ කරන ලදී. ඒ අනුව මෙවර ශ්‍රී ලංකා පරිපාලන සේවාවට බඳවා ගැනීමේ විභාගයේ උත්තර පත්‍ර පරීක්ෂාව සඳහා අපගේ ජ්යෙෂ්ඨ නිලධාරීන් 80 කට අධික සංඛ්‍යාවකට අවස්ථාව සලසා තිබුණි. නමුත් මෙවැනි අප සේවාවේ ගුණාත්මක භාවයට සෘජුවම බලපාන තත්වයන් ඉදිරියේදී ඇති නොවීමට විධිමත් සැලැස්මක් හා පැහැදිලි විධිවිධාන අපගේ බඳවා ගැනීමේ පටිපාටියට ඇතුලත් කරන ලෙස වන යෝජනාව රාජ්‍ය සේවා අමාත්‍යාංශයට ඉදිරිපත් කර ඇත.

e. සමෘද්ධි දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ තනතුරු යටපත් කර සමෘද්ධි කලමනාකරුවන් කණ්ඩායමකට අවිධිමත් ලෙස විධායක ශ්‍රේණියේ තනතුරු ඇතිකිරීමේ උත්සාහයක් ව්‍යර්ථ කිරීමට සංගමයේ මැදිහත් වීමෙන් කටයුතු කර ඇත.

f. රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ අවිධිමත් ලෙස විධායක ශ්‍රේණියේ තනතුරු ඇතිකිරීමේ උත්සාහයක් ව්‍යර්ථ කිරීමට සංගමයේ මැදිහත් වීමෙන් කටයුතු කර ඇත.

g. මෙවර ශ්‍රී ලංකා පරිපාලන සේවයේ වාර්ෂික ස්ථාන මාරු වඩාත් සාධාරණව හා විනිවිද පෙනෙන අයුරින් සිදුකිරීමට සංගමයේ පූර්ණ සහයෝගය හා සහභාගිත්වය ලබා දී ඇත.

h. මුදල් අමාත්‍යාංශයේ හා මහා භාණ්ඩාගාරයේ අවිධිමත් හා අනීතික ප්‍රතිව්‍යුහගත කිරීමේ යෝජනාව නිවැරදි කිරීම සඳහා සංගමය මැදිහත්වීම් සිදු කළ අතර මේ වනවිට එම යෝජනාවේ තිබූ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ තනතුරු 30ක් යටපත් කිරීම යන කරුණ සම්පූර්ණයෙන් අත්හිටුවීමට කටයුතු කර ඇත. අනෙක් ගැටළු නිරාකරණය සඳහා අධිකරණ ක්‍රියාමාර්ග ගෙන ඇත.

i. අභිනවයෙන් පත්වූ මැතිවරණ කොමිෂන් සභාව සමඟ මැතිවරණ පරිපාලනය හා ඒ සඳහා ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමයේ සාමාජිකයින්ගේ දායකත්වය පිලිබඳ සාකච්ඡා කරන ලදී.

j. ලංකා බැංකුව මඟින් සාමාජික සාමාජිකාවන්ට ණය පහසුකම් සැලසීමේ වැඩසටහනේ පොලී අනුපාත අඩුකර ගැනීමට සාකච්ඡා කර වෘත්තිකයන්ට ලබා දෙන නව පොලී අනුපාත අප සාමාජිකයින්ට ද ලබා ගැනීමට කටයුතු කර ඇත.

k. ලංකා බැංකුව මඟින් සාමාජික සාමාජිකාවන්ට ණය පහසුකම් සැලසීමේ වැඩසටහන යටතේ සාමාජිකත්ව ලිපි 150 කට අධික සංඛ්‍යාවක් නිකුත් කර ඇත.

l. අප සංගමයේ සාමාජිකයින් ඇතුළුව ප්‍රාදේශීය වශයෙන් කොවිඩ් වසංගතය හා සම්බන්ධ සේවා සපයන රජයේ නිලධාරීන්ට අවශ්‍ය මුඛ ආවරණ (මුල් අවස්ථාවේ ලක්ෂ දෙකක් හා පසුව ලක්ෂ තුනක්) සිංගප්පූරුවේ Temasek ආයතනයෙන් පරිත්‍යාග වශයෙන් ලබා ගැනීමට සංගමය මැදිහත් විය.

m. ඉහත කරුණු වලට අමතරව සංගමයේ සාමාජිකයින්ගේ දුක්ගැනවිලි බොහෝ සංඛ්‍යාවකට මැදිහත් වීමට සංගමයේ විධායක කමිටු සාමාජිකයින් කටයුතු කර ඇත. උදා- කොවිඩ් වසංගතය හේතුවෙන් ඊජිප්තුවේ සිරවී සිටි කෘෂිකර්ම අමාත්‍යාංශයේ නිලධාරියෙන් වන අප සංගමයේ සාමාජිකයෙක් ඇතුළු නිලධාරි කණ්ඩායමක් කඩිනමින් ගෙන්වා ගැනීම, රිදීගම ප්‍රා.ලේ. හා ස.ප්‍රා.ලේ ගැටළුව, වයඹ පළාත් සභාවේ සහකාර ලේකම්තුමිය උසස්වීම මත තනතුර ලබා නොදීම, බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන ලේකම් ඉවත් කිරීමට ගත් උත්සාහයක් ව්‍යර්ථ කිරීමට මැදිහත්වීම.

n. මහා මණ්ඩලයේ යෝජනාවක් අනුව ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන්ගේ ස්ථාන මාරු සඳහා වන යෝජනාවක් කමිටුවක් පත් කර සකස් කර අවසන් කර ඇත.

ගරු ලේකම්

| SASA 37th Executive Committee | | |
|---|---|---|
| **Designation** | **Name** | **# of Exco Meetings/ # of Attendance** |
| President | Mr Pradeep Rathnayaka | 25/25 |
| Secretary | Mr Aruna Devendra | 25/25 |
| Treasurer | Mr B A Pradeep Lakshantha | 25/25 |
| Deputy President | Mr Chandrarathna Pallegama | 25/04 |
| | Mr WMAPB Wanninayaka | 25/12 |
| | Mr KPG Sumith Shantha | 25/08 |
| | Mr S Achchuthan | 25/03 |
| | Mr S W Welgama | 25/00 |
| National Organizer | Mr WMMB Weerasekara | 25/09 |
| Editor | Mr Sreen Yapa Boralessa | 25/04 |
| Deputy Secretary | Ms KLMC Kularathna | 25/11 |
| Assistant Secretary | Mr Vinasiththamby Papakaran | 25/02 |
| Assistant Tresurer | Mr ISHJ Ilukpitiya | 25/07 |
| Assistant Editor | Mr SD Thewarapperuma | 25/18 |
| Committee Members | Mr Sanjeewa Bandukeerthi | 25/14 |
| | Ms Thanuja Fernando | 25/18 |
| | Ms TUG Rathnayake | 25/10 |
| | Mr WVP Anura | 25/06 |
| | Mr Dasun Rajapaksha | 25/00 |
| | Mr HA Kamal Pushpakumara | 25/03 |
| | Mr SM Al Ameen | 25/06 |
| | Mr CP Samarasinghe | 25/00 |
| | Mr EN Dayarathna | 25/14 |
| | Mr WGW Gnanathayalan | 25/01 |
| | Mr A Sivabalasundaran | 25/02 |
| | Mr Sunil Galagama | 25/03 |
| | Mr MAS Madhushanka | 25/07 |
| | Mr YSPP Gunarathna | 25/05 |
| | Ms WMGS Karunarathna | 25/00 |
| | Mr SH Sanjeewa Senevirathne | 20/02 |
| | Mr Shantha Weerasinghe | 20/15 |
| | Ms Anusha Gokula Fernando | 20/01 |
| | Ms Chathuri Nirukshika | 20/05 |
| | Ms THR Lakmali | 20/05 |
| | Ms BMBMA Batugedara | 20/03 |
| Committee Members (Ex-Officio) | Mr BK Prabath Chandrakeerthi | 25/08 |
| | Mr PPS Rohana De Silva | 25/15 |
| | Mr KP Yogachandra | 25/00 |

**වගුව 2**

**ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමය රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්තුමා සමඟ 2020.11.27 දින පැවති සාකච්ඡා සටහන්**

| අනු අං. | සාකච්ඡා කළ කරුණ | තීරණ |
|---|---|---|
| 01 | ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නව තනතුරු ඇති කළ යුතු බව.<br>පළාත් සභා, දෙපාර්තමේන්තු, ප්‍රාදේශීය පාලනය - දැනට සේවා ව්‍යවස්ථාවේ ඇති ස්ථානවල රාජකාරි කිරීම විධිමත් කිරීම.(2019 කණ්ඩායම) | දිස්ත්‍රික් ලේකම් කාර්යාල වල අතිරේක දිස්ත්‍රික් ලේකම් තනතුරු ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ තනතුරු ලෙස උසස් කිරීම සුදුසු බව සාකච්ඡා විය.<br>වසර දහය (10) ට වැඩි එකම සේවා ස්ථානයේ සිටින නිලධාරීන් අනිවාර්යයෙන් ස්ථාන මාරු කිරීමට එකඟ විය. |
| 02 | සේවා ව්‍යවස්ථාව සංශෝධනය කිරීම කාලානුරූපීව සිදු කිරීම -මේ සඳහා නිරන්තර සංවාදයක් ඇති කිරීම හා නිශ්චිත කාල රාමුවක් තුල ) වාර්ෂිකව, ද්විවාර්ෂික (... අවශ්‍ය සංශෝධන එක්කිරීම. (2019 කණ්ඩායම)<br>බඳවා ගැනීමේ විභාගයේ ප්‍රශ්න පත්‍ර සකස් කිරීම ,හා උත්තර පත්‍ර ඇගැයීමේ ක්‍රියාවලිය සඳහා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වැඩි ප්‍රමාණයක් අනිවාර්යයෙන් සම්බන්ධ කරවිය හැකිවන විධිවිධාන සේවා ව්‍යවස්ථාවටම එක් කිරීමට යෝජනා කෙරේ . මෙහිදී %50ක් විශ්ව විද්‍යාල මහාචාර්යවරුන් ,ආචාර්ය වරුන් හා %50ක් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ගෙන් සමන්විත මණ්ඩලයක් සුදුසු බව යෝජනා කරයි. (2019 කණ්ඩායම) | ශ්‍රී ල. ප. සේ. සේවා ව්‍යවස්ථාව සංශෝධනයට කාලානුරූපීව සිදුකිරීම අත්‍යවශ්‍ය කරුණක් වන බැවින් එයට අදාලව සංගමය ඉදිරිපත් කරන යෝජනා සලකා බැලීමට අමාත්‍යාංශය නිරන්තර සූදානමින් සිටින බව ප්‍රකාශ විය.<br>මෙම යෝජනා ඉදිරි සේවා ව්‍යවස්ථා සංශෝධනයකදී සලකා බැලීමට එකඟවිය. |
| 03 | සේවාරම්භක පුහුණුව හා ධාරිතා සංවර්ධන පුහුණුවට අදාල විස්තරාත්මක තොරතුරු )විෂයයන් (සේවා ව්‍යවස්ථාවේ ඇතුලත් කිරී (2019 කණ්ඩායම). | එම පුහුණු ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් අනන්‍යවූ රාජ්‍ය ප්‍රතිපත්ති හා පරිපාලන වෘත්තිකයින් ලෙස සංවර්ධනය කිරීමට ඉවහල් වන බව සංගමය පෙන්වා දෙන ලදී.<br>සේවාරම්භක පුහුණුව හා ධාරිතා සංවර්ධනය සමාලෝචනය සම්බන්ධව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සමඟ වෙනමම සාකච්ඡා කිරීම සුදුසු බව ලේකම්තුමා යෝජනා කරයි. |
| 04 | ශ්‍රී ලංකා පරිපාලන සේවය හා අනෙකුත් දීප ව්‍යාප්ත සේවා සඳහා බඳවාගැනීමේ පොදු ප්‍රශ්න පත්‍රයක් තැබීම. | මෙහිදී ශ්‍රී ල. ප. සේ. සේවා ව්‍යවස්ථාවෙන් නියම කර ඇති |

| | | |
|---|---|---|
| | (2019 කණ්ඩායම) | සුවිශේෂී අවශ්‍යතා (උදා. සමත් ලකුණු- 50) උල්ලංඝනය නොවන පරිදි කටයුතු කිරීමේ අවශ්‍යතාවය සංගමය පෙන්වා දෙන ලදී. පොදු විභාගය පිලිබඳව කටයුතු දැනටමත් රා.සේ.කො.ස. සිදුකරමින් පවතින බවත් ඉදිරියේ දී එම කටයුතු කඩිනම් කිරීමට බලාපොරොත්තු වන බවත් ලේකම්තුමා එකඟවේ. |
| 05 | ශ්‍රී ල.ප.සේ. 2017 කණ්ඩායම සේවයට පත්වී අදාල වසර 3 තුළ කාර්යක්ෂමතා කඩයිම් 1 (EB I) විභාගය 6 වරක් පැවැත්විය යුතු වුවද තවමත් පවත්වා ඇත්තේ සිව්වරක් පමණි. (2017 කණ්ඩායම) | කා.කඩයිම් විභාගය වසර 3ක් තුළ 6 වරක් පැවැත්වීම සිදුනොවීම නිසා නිලධාරීන්ට වූ අසාධාරණය වැළැක්වීමට අවශ්‍ය පියවර දැනටමත් ගෙන ඇති බව ලේකම්තුමා ප්‍රකාශ කරයි. |
| 06 | I. ශ්‍රී ලංකා පරිපාලන සේවය සඳහා ම වෙන්වූ පුහුණු වැය ශීර්ෂයක් හඳුන්වා දීම.<br>II. Ausawards වැනි අධ්‍යයන විදේශ පුහුණු ලබා ගැනීමට අවශ්‍ය පුහුණුව (Project proposal preparation වැනි) ලබා දීම<br>III. ඉංග්‍රීසි දැනුම ලබාගැනීමට British council පාඨමාලා කිරීමට අවස්ථාව ලබා දීම.<br>IV. පශ්චාත් (ආචාර්ය) උපාධි සඳහා විදේශ ගත වීමට පහසුකම් සැකසීම.<br>V. දුර පළාත්වල සිටින ස.ප්‍රා.ලේ. වරුන්ට වසර 5 කට වරක්වත් කැමති තැනකට ස්ථාන මාරුවීමට අවස්ථාව ලබා දීම.<br>VI. ප්‍රථම පත්කිරීමේදී නිලධාරීන් පත්කරන නිවැරදි ක්‍රමයක් සකස් කිරීම. සෑම නිලධාරියෙකුටම ප්‍රාදේශීය පරිපාලනයේ, පළාත් සභා වැනි ක්ෂේත්‍රවල පලපුරුද්ද අත්‍යවශ්‍ය කිරීම<br>VII. මාරුවීමේ ප්‍රතිපත්තිය රටටම පොදු එකක් වන සේ සැකසීම.<br>VIII. 2015 කණ්ඩායම II පන්තියට යාම කඩිනම් කිරීම.<br>(2015 කණ්ඩායම) | 6.I සිට 6.III දක්වා කරුණු ඉහත අනු අංක 03 හි තීරණ යටතේ වන ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සමඟ සාකච්ඡාවේදී ඉදිරිපත් කරන ලෙසත් එහිදී අවශ්‍ය තීරණ ලබා දිය හැකි බවත් ලේකමතුමා ප්‍රකාශ කරයි.<br><br>6.IV කරුණ ඉදිරි ප්‍රතිපත්තිමය කරුණු පිලිබඳ ඉහල මට්ටමේ සාකච්ඡා වලදී ඉදිරිපත් කිරීමට එකඟවේ.<br><br>6.V සිට 6.VII දක්වා වන කරුණු සඳහා විධිමත් ක්‍රමයක් සකස් කර එය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලෙස ද ඉන් පසු එය සලකා බලා ආයතන ගත කිරීමට ද එකඟවේ.<br><br>6. VIII කරුණ සම්බන්ධයෙන් මේ වන විට 2012 දක්වා කණ්ඩායම් II ශ්‍රේණියට උසස් කිරීමට අදාල ආයතන කටයුතු අවසන් කර ඇති බවත් ඉතිරි කණ්ඩායම් II ශ්‍රේණියට උසස් කිරීමට අවශ්‍ය කටයුතු කඩිනමින් සිදු කරන බවත් අධ්‍යක්ෂ (ශ්‍රී ල.ප.සේ.) ප්‍රකාශ |

| | | |
|---|---|---|
| | | කරයි. |
| 07 | I. විවෘත හා සීමිත කණ්ඩායම්වලට එකවර සේවාරම්භක පුහුණුව ලබාදීම.<br>II. පරිපාලන සේවයේ පුරප්පාඩු පිරවීමට සම්මුඛ පරීක්ෂණ සඳහා නිලධාරීන් අවශ්‍ය පමණ මෙන් දෙගුණයක් කැඳවීම.<br>III. සේවාරම්භක පුහුණුවේ අන්තර්ගතය සේවයේ ප්‍රමානයට උපකාරී වනසේ සංශෝධනය කිරීම (මේ සඳහා 1.විශ්‍රාමික හා දැනට සේවයේ සිටින ප්‍රවීනයන්ගෙන් යුත් කමිටුවක් පත්කර නිර්දේශ ලබා ගැනීම. 2. එසේම British Council වැනි පිළිගත් ආයතනයක උපකාරයෙන් ශ්‍රී.ල.ප.සේ. ගැලපෙන මට්ටමේ ඉංග්‍රීසි පුහුණුවක් ලබා දීම 3. සේවාරම්භක පුහුණුව අවසානයේ දී සන්නිවේදන හැකියාව, කාල කළමනාකරණය, Team work, Leadership and Personality Development වැනි වැදගත් ක්ෂේත්‍ර වැඩි දියුණු කිරීමට හැකිවන පරිදි පාඨමාලාව සංශෝධනය කිරීම)<br>IV. නිලධාරීන් ඉහල අධ්‍යාපනය හදාරා ඇති ක්ෂේත්‍ර ලබා ඇති පුහුණුවීම් ආදිය සැලකිල්ලට ගනිමින් විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන වෙත ස්ථාන මාරුවීම් සිදු කිරීම. මේ සඳහා ශ්‍රී.ල.ප.සේ. නිලධාරීන් පිළිබඳ දත්ත එකතුවක් යාවත් කාලීන කරමින් පවත්වාගෙන යාමද අවශ්‍ය වේනම් ස්ථාන මාරු වීම් සිදුකිරීම සඳහා කුසලතා ලකුණු ක්‍රමයක් සලකා බැලීමද සුදුසුය) විධිමත් ස්ථාන මාරු පටිපාටියක අත්‍යාවශ්‍ය වේ. මෙහි දී සුහද මාරු සඳහා ලිහිල් ප්‍රතිපත්තියක් හා සරල ක්‍රමවේදයක් සකස්කිරීමට යෝජනා කරයි. අලුත් SLAS පත්කිරීම් කරන විට ප්‍රථමයෙන් පැරණි නිලධාරීන්ට ස්ථානමාරු සඳහා අවස්ථාවක් ලබා දීය යුතු වේ.<br>V. දෙපාර්තමේන්තු වල සේවයේ යෙදෙන පරිපාලන සේවයේ නිලධාරීන් දිස්ත්‍රික් වල තනතුරු වලට පත් කිරීමේ ක්‍රමවේදය රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ විධිමත් නියාමනයෙන් ඉවත් වී ඇත. සමහර (මුදල් අමාත්‍යාංශය වැනි) | 07.I හා 07.III ඉහත අනු අංක 03 තීරණය පරිදි ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සමඟ සාකච්ඡා කර තීරණය කළ යුතු වේ.<br><br>07.II පරිදි කටයුතු කිරීමෙන් බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටියේ විනිවිද භාවය හා අපක්ෂපාතී භාවය පිලිබඳ විවිධ විවේචන/විරෝධතා මතුවිය හැකි බවත් ඒ තුලින් දැනට පවතින බඳවාගැනීම පිලිබඳ විශ්වාසනීයත්වය අඩුවිය හැකි බවත් ලේකම්තුමා පෙන්වා දෙයි.<br><br>7.IV, 7.V, හා 7.VI කරුණු ඉහත 6.V සිට 6.VII දක්වා වන කරුණු සඳහා වන තීරණය පරිදි විධිමත් ක්‍රමයක් සකස් කිරීමේදී ඇතුලත් කර එය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලෙස ද ඉන් පසු එය සලකා බලා ආයතන ගත කිරීමට ද එකඟවේ. |

| | | |
|---|---|---|
| | ආයතන තමන්ටම සුවිශේෂී වූ ස්ථාන මාරු ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමෙන් උද්ගත වී ඇති ගැටළු ද පවතී.<br>VI. නිලධාරීන්ට තමා උනන්දුවක් දක්වන ක්ෂේත්‍රවලට අදාලව ප්‍රවීනතා ලබා ගැනීමට අවස්ථාව ලබා දීම.<br>(2014 කණ්ඩායම) | |
| 08 | I. කණ්ඩායම් ප්‍රවාහන පහසුකම ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III පන්තියේ නිලධාරීන්ට ලබාදීම.<br>II. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සියලු පන්තින් සඳහා අදාළ දිනයට උසස්වීම ලබාදීමට පෙර සුදානම තිබිය යුතු වීම.<br>III. ශ්‍රී ලංකා පරිපාලන සේවය සඳහා කුඩා කණ්ඩායම් බඳවා ගන්නා ලේස යෝජනා කරයි. වාර්ෂික බඳවා ගැනීම සහතික කිරීමෙන් සංඛ්‍යාත්මකව කුඩා කණ්ඩායම් වශයෙන් (100ට අඩු) බඳවා ගැනීම<br>IV. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් හට රැකියා සඳහා විදේශ ගත වීමට වසර 5 කට වැටුප් වර්ධක සහිතව නිවාඩු ලබාගැනීමට අවස්ථාව සැලසීම. (2013 කණ්ඩායම) | දැනටමත් එක් එක් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වල ඇති භෞතික/මානව/මූල්‍ය සම්පත් ප්‍රමාණයන්ට යටත්ව සියළුම නිලධාරීන්ට කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් ලබාදීමට අවශ්‍ය විධිවිධාන සලසා ඇත.<br>08.II සඳහා 06. VIII තීරණය අදාල වේ.<br>08.III එකඟවේ. ඉදිරි බඳවා ගැනීම් විධිමත්ව හා කඩිනම්ව සිදුකිරීමට කටයුතු යොදා ඇති බැවින් ප්‍රමාණාත්මකව කුඩා කණ්ඩායම් බඳවා ගැනීමට හැකි වනු ඇත.<br>08.IV සඳහා 06.IV තීරණය පරිදි හා මෙවර අයවැයෙන් විධායක නොවන නිලධාරීන් වෙනත් රැකියාවල යෙදීමට අවසර ලබාදීමට වූ යෝජනාව ද සැලකිල්ලට ගෙන ඉදිරි ප්‍රතිපත්තිමය සංශෝධන වලදී ඉදිරිපත් කිරීමට එකඟවේ. |
| 09 | I. ධාරිතා සංවර්ධන පුහුණුවේ online modules ප්‍රමාණය වැඩි කිරීම.<br>II. තවමත් 2012 කණ්ඩායමේ ධාරිතා සංවර්ධන පුහුණුව ආරම්භ කර ඇත්තේ නිලධාරීන් විසි දෙනෙකු පමණි. ඔවුන් සඳහා කඩිනමින් ධාරිතා සංවර්ධන පුහුණුව ලබාදීම.<br>III. දෙවන භාෂා ප්‍රවීණතාවය (දෙමළ) කැබිනට් පත්‍රිකාවට අනුව චක්‍රලේඛ නිකුත්කිරීම.<br>IV. පළමු පන්තියේ තනතුරු ගණනය කිරීමේදී ද්විතීයික පදනම මත සේවය කරන පිරිස ද ගණනය කළ යුතුව ඇත.( 2012 කණ්ඩායම) | 09.I හා 09.II කරුණු සඳහා ඉහත අනු අංක 03 තීරණය පරිදි ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සමඟ සාකච්ඡා කර තීරණය කළ යුතු වේ.<br>09.III කරුණ සඳහා දැනටමත් අදාල චක්‍රලේඛය නිකුත් කර ඇත.<br>09.IV මේ පිළිබඳව සොයා බලා කටයුතු කිරීමට එකඟවේ. |
| 10 | I. දෙමල භාෂා අවශ්‍යතාවය සපුරා ගැනීමට දී තිබෙන කාලය දීර්ඝ කිරීම. | |

| | | |
|---|---|---|
| | II. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ දෙවන පන්තියට උසස් කිරීමේදී දෙමළ භාෂාව අවශ්‍යතාවය පළමු පන්තිය සඳහා (Class I) වලට උසස් කිරීමේ අවශ්‍යතාවයක් බවට පත් කිරීම<br>III. ආගමන විගමන සහ මෝටර් රථ දෙපාර්තමේන්තු වැනි දෙපාර්තමේන්තුවල කාලය වසර 5 දක්වා දීර්ඝ කල යුතු බව.<br>IV. කාන්තා නිල ඇඳුම සඳහා සාරිය හැර වෙනත් සුදුසු ඇඳුම් සඳහා අනුමැතිය ලබාදීම (2010 කණ්ඩායම). | 10.III කරුණ සම්බන්ධව රාජ්‍ය ආයතන වල සංවෘත්ත සේවා අහෝසි කිරීමට රජයේ යෝජනාවක් තිබෙන බැවින් ඉදිරියේදී මෙවැනි ප්‍රිය මනාප සේවා ස්ථාන හා එම සේවා ස්ථාන සඳහා නියම කර ඇති අනිවාර්ය සේවා කාල ආදිය අහෝසි වී යනු ඇති බව සාකච්ඡා විය.<br>10.IV කරුණ සම්බන්ධව විවිධ යෝජනා තිබෙන අතර එසේ කාන්තාවන්ගේ නිල ඇඳුම වෙනස් කිරීමක් සිදුකරන්නේ නම් ඒ සඳහා නිශ්චිත විකල්පයක් යෝජනා කිරීම සුදුසු බව සාකච්ඡා විය. |
| 11 | I. 2009 කණ්ඩායම දැනට දෙවන පන්තියට උසස් වී ඇත. සේවා කාලය අවුරුදු 11 මාස කිහිපයක් ගතකර ඇත. වසර 10 ක සේවා කාලයක් පසුකර ඇති බැවින් පුරප්පාඩු මත පළමු පන්තියට උසස් වීම් ලබා දීම.<br>II. ධාරිතා සංවර්ධන පුහුණුව කඩින්කඩ නොමැතිව එකවර සිදුකිරීම.<br>III. යුධ හමුදාව සඳහා ලබා දෙන විදේශ පුහුණු මෙන් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් සඳහා අනිවාර්ය විදේශ පුහුණු ලබාදීම.<br>IV. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ තනතුරු සඳහා තරුණ නිලධාරීන් (වයස 65ට අඩු) පත් කිරීම.<br>V. වැඩ බැලීමේ හා රාජකාරි ආවරණය කිරීමේ පත්කිරීම් සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීම (2009 කණ්ඩායම) | 11.I දැනටමත් 2009 හා 2010 කණ්ඩායම් වලට වැඩබැලීමේ හා රාජකාරි ආවරණය කිරීමේ අවස්ථා ලබාදී ඇති බැවින් දැනට පවතින 1 පන්තියේ නිලධාරි අඩුපාඩුව මහ හරවා ගත හැකි වීඇති බවත් 2021 මාර්තු මාසයේදී 2009 කණ්ඩායම 1 පන්තියට උසස්කිරීමට අදාල කටයුතු යොදා ඇති බැවින් ඉදිරියේදී 1 පන්තියේ පුරප්පාඩු අල්ප වනු ඇති බවත් අධ්‍යක්ෂ ශ්‍රී ල.ප.සේ. ප්‍රකාශ කරයි.<br>11.II, 11.III, 11.IV, ඉහත අනු අංක 03 තීරණය පරිදි ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සමඟ සිදුකරන සාකච්ඡාව සඳහා මෙම කරුණු ඇතුලත් කර ගැනීමට එකඟ වේ.<br>11.V ඉහත 6.V සිට 6.VII දක්වා වන කරුණු සඳහා වන තීරණය පරිදි විධිමත් ක්‍රමයක් සකස් කිරීමේදී ඇතුලත් කර එය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලෙස ද ඉන් පසු එය සලකා බලා ආයතන ගත කිරීමට ද එකඟවේ. |
| 12 | I. පත්වීමේ දිනය පෙර දාතම් කිරීම. Merit | 12.I, 12.II, 12.III, මේ පිලිබඳව සොයා |

| | | |
|---|---|---|
| | කණ්ඩායමට පෙර දිනයක් ලබාදීම.<br>II. නිසිකලට SLAS I II යාමට නොහැකි වූ අයට විශේෂයෙන් සලකා බලා සාධාරණයක් ඉටුකිරීම.<br>III. භාෂා ප්‍රවීනතා විභාග නැවත සමාලෝචනය කිරීම සහ තත්වය අඩු කිරීම. (2007 කණ්ඩායම) | බලා කරුණු ඉදිරිපත් කිරීමට අධ්‍යක්ෂ ශ්‍රී ල.ප.සේ. එකඟවේ. |
| 13 | I. පරිපාලන සේවයේ පළමු පන්තියට පත්වී වසර තුන හමාරක් ගත වුවද ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන් එකක්වත් කර නැත.<br>II. ධාරිතා සංවර්ධන පාඨමාලාවේ අන්තරගතය සහ ගුණාත්මක භාවය වෙනස් විය යුතුය. අනිවාර්ය නොවන කොටස් ඉවත් කළ යුතුය. විෂය දැනුම විශාල පරාසයක් තුල පැතිරී යා යුතුය.<br>III. ශ්‍රී ලංකා පරිපාලන සේවය සඳහා විෂය පරාසයන් හදුන්වා දිය යුතු බව<br>උදා - කෘෂිකර්මය, කර්මාන්ත, ආයතන අංශය, ආර්ථික කටයුතු, සෞඛ්‍ය, පළාත් සභා, ප්‍රාදේශීය/දිස්ත්‍රික් පාලන<br>IV. ප්‍රියමනාප ස්ථානවල කාලය වසර 3 , වසර 5 දක්වා දීර්ඝ කිරීම. (RMV, ආගමන විගමන, රේගුව)<br>V. දෙපාර්තමේන්තු/අමාත්‍යාංශවල සැලසුම් හා සංවර්ධන යන විෂයය ප්‍රතිපත්ති හා සංවර්ධන ලෙස වෙනස් වියයුතු ඉවට යෝජනා කරයි. උදා. අතිරේක ලේකම් (ප්‍රතිපත්ති හා සංවර්ධන) (Policy & Development)<br>VI. පරිපාලන සේවයේ උන්නතිය පිණිස SLIDA හි පාඨමාලා නවීකරණය කිරීම.<br>VII. Resource Pool එකක් සකස් කිරීම. (2006 කණ්ඩායම) | 13.I 2006 කණ්ඩායමේ ධාරිතා සංවර්ධන වැඩසටහන දැනටමත් ආරම්භ කර ඇත.<br>13.II, 13.III, ඉහත අනු අංක 03 තීරණය පරිදි ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සමඟ සිදුකරන සාකච්ඡාව සඳහා මෙම කරුණු ඇතුලත් කර ගැනීමට එකඟ වේ.<br>13.IV සංවෘත්ත සේවා ඉවත් කිරීමේ රජයේ පොදු තීරණය අනුව ප්‍රිය මනාප සේවා ස්ථාන තවදුරටත් වලංගු නොවනු ඇති බව ලේකම්තුමා පෙන්වා දෙයි.<br>13.V එකඟ වේ.<br>13.VI, 13.VII ඉහත අනු අංක 03 තීරණය පරිදි ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සමඟ සිදුකරන සාකච්ඡාව සඳහා මෙම කරුණු ඇතුලත් කර ගැනීමට එකඟ වේ. |
| 14 | I. ධාරිතා සංවර්ධන පුහුණුව සඳහා විදේශ පුහුණුව ඕස්ට්‍රේලියාව, එංගලන්තය වැනි රටවලදී ලබාදීම<br>II. ආචාර්ය උපාධි ලබාගැනීමට අවස්ථාව ලබාදීම<br>III. පළපුරුදු ලේකම්වරුන්ගෙන් 2006, 2003, 1998, 1995, කණ්ඩායම් සඳහා පුහුණුවක් | 14.I, 14.III ඉහත අනු අංක 03 තීරණය පරිදි ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සමඟ සිදුකරන සාකච්ඡාව සඳහා මෙම කරුණු ඇතුලත් කර ගැනීමට එකඟ වේ.<br>14.II ඉල්ලීම ඉදිරි ප්‍රතිපත්තිමය තීරණ |

| | | |
|---|---|---|
| | ලබාදීම (2003 කණ්ඩායම) | වලදී සලකා බැලීමට එකඟ වේ. |
| 15 | I. ප්රාදේශීය පරිපාලනයේ ස.ප්‍රා.ලේ. මට්ටමට පුහුණු අවස්ථා වැඩියෙන් ලබාදීම.<br>II. අලුත් කාර්යයන් සඳහා නව දෙපාර්තමේන්තු පිහිටුවීම.<br>III. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සහ විශේෂ ශ්‍රේණියේ පුරප්පාඩු ප්‍රසිද්ධ කිරීම.<br>IV. දැනට පවතින කුසලතා පදනමින් බඳවා ගැනීම අහෝසිකර එම ප්‍රමාණයට අනෙකුත් දීප ව්‍යාප්ත සේවාවල නිලධරයන්ට ශ්‍රී.ලං.ප.සේ . වෙත ඇතුල් වීමට අවස්ථාව සැලසීම (2000 කණ්ඩායම) | 15.I, ඉදිරියේ දී කටයුතු කිරීමට එකඟ වේ.<br>15.III, අමාත්‍යාංශ වෙබ් අඩවියෙහි ශ්‍රී ල.ප.සේ. පිටුව ඉදිරියේදී යාවත්කාලීන කිරීමට නියමිත අතර එහිදී මෙම තොරතුරු ද ඇතුලත් කිරීමට නියමිතයි.<br>15. IV ඉදිරි ප්‍රතිපත්තිමය තීරණ වලදී සලකා බැලීමට එකඟ වේ. |
| 16 | I. විදේශ සේවා තනතුරු වලට පරිපාලන සේවයේ නිලධාරීන් පත්කිරීම.<br>II. විදේශ සේවයේ ජොෂ්ඨ තනතුරු වලට SLAS නිලධාරීන් තෝරා ගැනීම.<br>III. වයස 61 දක්වා විශ්‍රාම වයස දීර්ඝ කරන්න. (1998 කණ්ඩායම) | 16. I, 16.II, 16.III, ඉදිරි ප්‍රතිපත්තිමය තීරණ වලදී සලකා බැලීමට එකඟ වේ. |
| 17 | I. පරිපාලන සේවයේ ඉහළ තනතුරු අහිමි වීම<br>II. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ උපලේඛනගත තනතුරු අහිමි වීම<br>III. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය ප්‍රතිසංවිධානය කිරීම. ආධුනික පුහුණුව නේවාසික පුහුණුවක් කිරීම.<br>IV. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන්ගේ තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් සැකසීම.<br>V. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් පත් කිරීම් පිළිබඳව ප්‍රථම උපාධිය සැලකීමට ගන්න. (1995 කණ්ඩායම) | 17.I, 17.II<br>17.II, 17.III, අනු අංක 03 තීරණය පරිදි ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සමඟ සිදුකරන සාකච්ඡාව සඳහා මෙම කරුණු ඇතුලත් කර ගැනීමට එකඟ වේ.<br>17.IV ඉහත 15. III පරිදි අමාත්‍යාංශ වෙබ් අඩවියෙහි ශ්‍රී ල.ප.සේ. පිටුව ඉදිරියේදී යාවත්කාලීන කිරීමට නියමිත අතර එහිදී මෙම තොරතුරු ද ඇතුලත් කිරීමට නියමිතයි.<br>17.V ඉහත 6.V සිට 6.VII දක්වා වන කරුණු සඳහා වන තීරණය පරිදි විධිමත් ක්‍රමයක් සකස් කිරීමේදී ඇතුලත් කර එය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලෙස ද ඉන් පසු එය සලකා බලා ආයතන ගත කිරීමට ද එකඟවේ. |
| 18 | I. රාජ්‍ය ලේකම්වරුන් විශ්‍රාම යාමේදී අමාත්‍යාංශ ලේකම්වරයෙක් මෙන් ලේකම් තනතුර සහිතව විශ්‍රාම යැවීම (යුධ හුමුදාවේ මෙන්ම)<br>II. ලේකම් තනතුරු දරන අයට පුද්ගලික | 18.I, 18.II<br>18.III, 18.IV, 18.V, 18.VI ඉහත 6.V සිට 6.VII දක්වා වන කරුණු සඳහා වන තීරණය පරිදි විධිමත් ක්‍රමයක් සකස් |

| | | |
|---|---|---|
| | සහායකයෙකු ලබාදීම.<br>III. ප්‍රථම පත්කිරීමේදී නිලධාරීන් පත්කරන නිවැරදි ක්‍රමයක් සකස් කිරීම.<br>IV. සෑම නිලධාරියෙකුටම ප්‍රාදේශීය පරිපාලනයේ, පළාත් සභා වැනි ක්ෂේත්‍රවල පලපුරුද්ද අත්‍යවශ්‍ය කිරීම.<br>V. අලුත් SLAS පත්කිරීම් කරන විට ප්‍රථමයෙන් පැරණි නිලධාරීන්ට අවස්ථාවක් ලබා දීම.<br>VI. මුල් වසර 3 ප්‍රාදේශීය පරිපාලනයේ සිටිය පසුව නිලධාරීන් ක්ෂේත්‍රගත කිරීම එක් එක් ක්ෂේත්‍ර වලට වර්ග කිරීම.<br>VII. SLAS නිලධාරීන් වසර 1 ක් හෝ වසර 2 ක් පුද්ගලික අංශයේ වැඩ කිරීමට පඩි සහිත නිවාඩු ලබා දීම.<br>VIII. වයස 61 දක්වා විශ්‍රාම වයස දීර්ඝ කිරීම.<br>IX. රජයේ ප්‍රතිපත්තිමය තීරණ මත තනතුරු අහිමි වන හෝ ඉහල තනතුරක සිට පහළ තනතුරකට හෝ සංචිතයට යාමට සිදුවන නිලධාරීන්ට කල්පිත විශ්‍රාමික සියළු වරප්‍රසාද (අදාල ඉහල තනතුරේ සේවය කල යුතු යම් අවම කාලයක් නොසලකා) ලබා විශ්‍රාම යාමට හැකි වන විධිවිධාන යෝජනා කිරීම.<br>X. ප්‍රාදේශීය සභා වල ශ්‍රී ලංකා පරිපාලන සේවයේ තනතුරු පිලිබඳව අධ්‍යයනය කර වහා තීරණයක් ගත යුතුයි (අහෝසි කිරීම සුදුසු බව වැඩි පිරිසකගේ යෝජනාවයි( (1992 කණ්ඩායම) | කිරීමේදී ඇතුලත් කර එය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලෙස ද ඉන් පසු එය සලකා බලා ආයතන ගත කිරීමට ද එකඟවේ.<br>18.VII, 18. VIII රජයේ පොදු ප්‍රතිපත්ති වලට අනුකූලව ඉදිරියේදී සලකා බැලීමට එකඟවේ.<br>18.IX මෙම විධිවිධාන දැනටමත් සලසා ඇති බව ලේකම්තුමා පෙන්වා දෙයි.<br>18.X මෙම තනතුරු බොහොමයක් දැනටත් පුරප්පාඩුව පවතින බැවින් මේ සම්බන්ධව කඩිනමින් තීරණයක් ගැනීමට එකඟ වේ. |
| 19 | ප්‍රාදේශීය ලේකම් වරුන්ගේ හා සහකාර ප්‍රාදේශීය ලේකම් වරුන්ගේ සංගමයේ යෝජනා<br>I. ප්‍රාදේශීය පාලනය පිලිබඳ යාවත්කාලීන කිරීමේ පුහුණුවක් හා නායකත්ව පුහුණුවක් ලබාදීම (වසරකට අවම සති දෙකක් වන අනිවාර්ය පුහුණුවක්) හා ඒ සඳහා නේවාසික පුහුණු මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම.<br>II. ශ්‍රී ල.ප.සේ. මුල් පත්වීම සහකාර ප්‍රාදේශීය ලේකම් තනතුරක් ලබාදීම හා දුෂ්කර කොට්ඨාශ සඳහා විශේෂ දීමනාවක් ලබාදීම. මේ මඟින් නිශ්චිත සේවා කාලයකින් පසු (වසර 3ක්) ප්‍රාදේශීය ලේකම් වරුන්ට හා සහකාර ප්‍රාදේශීය ලේකම් වරුන්ට ස්ථාන මාරු වීමට අවස්ථාව ලබාදීම. | 19.I ඉහත අනු අංක 03 තීරණය පරිදි ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සමඟ සිදුකරන සාකච්ඡාව සඳහා මෙම කරුණු ඇතුලත් කර ගැනීමටත් පුහුණු මධ්‍යස්ථානයක් සඳහා මීට පෙර කටයුතු කර ඇති බැවින් එම කටයුතු යාවත්කාලීන කඩිනම් කිරීමටත් එකඟ වේ.<br>19.II ඉහත 6.V සිට 6.VII දක්වා වන කරුණු සඳහා වන තීරණය පරිදි විධිමත් ක්‍රමයක් සකස් කිරීමේදී ඇතුලත් කර එය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලෙස ද ඉන් පසු එය |

| | | | |
|---|---|---|---|
| | III. | වැඩ ආවරණ තනතුරු සඳහා වෙනත් නිලධාරීන් පත් කිරීමේදී එතෙක් වැඩබැලීම/ආවරණය කළ නිලධාරීන්ට අගතියක් නොවන පරිදි ජ්‍යෙෂ්ඨ නිලධාරීන් පත්කිරීම. | සලකා බලා ආයතන ගත කිරීමට ද එකඟවේ.<br>19.III ඉහත 6.V සිට 6.VII දක්වා වන කරුණු සඳහා වන තීරණය පරිදි විධිමත් ක්‍රමයක් සකස් කිරීමේදී ඇතුලත් කර එය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලෙස ද ඉන් පසු එය සලකා බලා ආයතන ගත කිරීමට ද එකඟවේ. |